**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය - 2015**

**-----------------------------------------------------------------**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 56(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු වූ කුලී රු. 180,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) වාර්ෂික බදු කුලී රු. 99,000 ක් සහ ඉඩමක් බදු ගැනීමේ මූලික තැන්පතු රු. 297,000 ක් ඉඩම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

**2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්**

ප්‍රාදේශීය කාර්යාල 3 ක් විසින් පවත්වා තිබූ බැංකු ගිණුම් 3 ක මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මුදල් ශේෂයට වඩා මුදල් පොතේ ශේෂය රු. 334,712 කින් වැඩි වී තිබූ අතර තවත් ගිණුමක ශේෂය මුදල් පොතේ ශේෂයට වඩා රු. 346,586 කින් අඩුවී තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 56,146,515 ක් වූ ණයගැති ශේෂයෙන් වර්ෂ 05 ඉක්මවූ රු. 3,088,709 ක් වූ ණයගැති ශේෂ 35 ක් ද, වර්ෂ 03 ත් 05 ත් අතර පැවතෙන රු. 1,088,351 ක් වූ ණයගැති ශේෂ 03 ක් ද, වර්ෂ 01 ත් 03ත් අතර පැවතෙන රු. 51,969,455 ක් වූ ණයගැති ශේෂ 34 ක්ද පැවැතුණි.

(i) 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී අධිකාරිය විසින් මිලදී ගැනීම් කටයුතු වෙනුවෙන් ලබාදී තිබූ රු. 571,196 ක් වූ අත්තිකාරම් හා අධිකාරියේ ජාතික මධ්‍යස්ථානයක් වෙත 2012 වර්ෂයේදී ලබා දී තිබූ රු. 763,476 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(ii) සේවක ණය ශේෂ තුල දීර්ඝ කාලයක සිට පැවත එන සේවය හැර ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු. 104,328 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 05 ඉක්මවූ රු.252,895 ක් වූ ණයහිමි ශේෂ 9 ක් ද වර්ෂ 03 ත් 05 ත් අතර රු. 117,525 ක්වූ ණයහිමි ශේෂ 02 ක් ද වර්ෂ 01 සිට 03 දක්වා වූ රු.12,766,539 ක ණයහිමි ශේෂ 45 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් කර නොතිබුණි.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණය ගැති ශේෂයෙන් රු. 14,270,952 ක් ප්‍රධාන කාර්යාලය සහ ජාතික මධ්‍යස්ථාන 03 සහ දිස්ත්‍රික් මධ්‍යස්ථාන අතර ඇති වූ අභ්‍යන්තර ගනුදෙනු මත වූ ශේෂ විය. එදිනට ණයහිමි ශේෂය රු.13,136,958 ක් වූ අතර ඒ තුල අන්තර්ගත ඉහත පරිදි වූ ගනුදෙනු මත වූ ශේෂ රු. 8,256,064 ක් විය. මෙම අභ්‍යන්තර ගණුදෙනු මත වූ ණය ගැති හා ණයහිමි ශේෂ අතර වර්ෂ 5 ඉක්මවා තිබූ නමුත් නිරවුල් කර නොගත් රු.815,596 ක් වූ ශේෂ 14 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු. 43,942,849 ක් වූ අතර එයින් රු. 27,448,816 ක් ජාතික පුහුණු මධ්‍යස්ථාන තුනෙහි ආධුනිකයන්ගෙන් අයකර තිබූ රු. 5,000 බැගින් වූ ආපසු ගෙවිය යුතු තැන්පතුවලින් සමන්විත වී තිබුණි. ඉන් පුහුණුව අවසන් කර ආයතනයෙන් ඉවත්ව ගිය ආධුනිකයන් විසින් ආපසු ලබානොගත් ආසන්න වශයෙන් රු. 10,000,000 ක මුදලක් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | රාජ්‍ය නිලධාරීන් කාර්යාල වේලාවෙන් බැහැරව කරන ලද දේශන වෙනුවෙන් ලබන දීමනාවලින් සියයට 10 ක් රාජ්‍ය භාගය ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු. 2,658,079 ක් වූ අධිකාරියේ අර්ධ කාලීන පාඨමාලාවල දේශන ගාස්තු මත රු. 265,807 ක් වූ රාජ්‍ය භාගය අයකර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.510,100 ක් වූ චෙක්පත් 9ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර වර්ෂ 5 කට පෙර තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 26,211 ක් හා මුදල් ඇණවුම් 17 ක් සම්බන්ධයෙන්ද අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 702 (3) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | ගිණුම් සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඈ)වගන්තිය | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව මොඩියුල 11000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු. 1,972,500 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 53 වගන්තිය | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අරමුදල නමින් අරමුදලක් පිහිටුවා භාණ්ඩාගාර ප්‍රදාන ඇතුළු සියළු ආදායම්ද හර කිරීමට සහ අනුමත සියළු වියදම් එයට බැර කර අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතු වේ. එසේ වුවද මධ්‍යම අරමුදල (Central Fund) නමින් අරමුදලක් පිහිටුවා තිබූ නමුත් එහි මෙහෙයුම් කටයුතු පනතේ සඳහන් පරිදි සිදු නොවූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු. 51,779,776 ක් භාණ්ඩාගාරයෙහි තැන්පත් කර නොතිබුණි. |
| (ඊ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී එෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරිය තුල අරමුදල් 6 ක් පිහිටුවා තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදල්වල ශේෂ එකතුව රු.25,479,552 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 84,748,374 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.19,566,476 ක් වීමෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.65,181,898 ක පිරිහීමක් ඇති වී තිබුණි. භාණ්ඩාගාර ප්‍රදාන රු. 35,000,000 කින්

වැඩි වී පුහුණු වියදම් රු. 77,760,934 කින් අඩුවී තිබුණ ද පුද්ගලික පඩිනඩි රු. 151,042,770 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් ඇති වී තිබූ අතර 2014 වර්ෂයේ දී රු. 19,566,476 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වන විට රු. 84,748,374 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ රු. 278,586,424 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 603,161,305 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන් තිදෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම පැහැර හැරීම හා සේවයෙන් පහ කිරීම සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව විසින් අධිකාරියට එරෙහිව නඩු 02 ක් හා සේවයෙන් පහකිරීම, පාරිතෝෂික නොගෙවීම හා සේවක අර්ථ සාධක අධිභාර අයකර ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන් සිව් දෙනෙකු විසින් අධිකාරියට එරෙහිව නඩු 03ක් පවරා තිබුණි.

(ආ) අධිකාරියට අයත් වැල්ලවත්ත පුහුණු මධ්‍යස්ථාන ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අධිකාරිය විසින් බාහිර පාර්ශවයකට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ අරමුණු වූ වෘත්තීය පුහුණු සැලසුම් කිරීම හා ලබාදීම, පුහුණු සම්මතයන් නිශ්චය කිරීම, විභාග පැවැත්වීම වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම, පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම සහ සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමත්වයෙහිලා සැලකීම සඳහා අදාල කටයුතු කිරීම සහ බලාත්මක කිරීම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධනයන් සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකර නොතිබූ හා ප්‍රමාණවත් පරිදි ඉටුනොකළ කාර්යයන් පහත පරිදි වේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව ආධුනිකයන් 425 ක් සඳහා වූ පුහුණු වැඩසටහන් 40 ක් පවත්වා නොතිබුණු අතර සැලසුම් කර නොතිබූ පුහුණු වැඩසටහන් 21 ක් පවත්වා තිබුණි. ඒ සඳහා ආධුනිකයන් 699 දෙනෙකු සහභාගී වී තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම තුල හඳුනාගෙන තිබූ නමුත් වර්ෂය තුළ පැවැත්වීම සඳහා සැලසුම් නොකර අතහැර දමා තිබූ පාඨමාලා සංඛ්‍යාව 66 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂයේ පුහුණුව සඳහා ආධුනිකයින් 27,000 ක් බඳවා ගැනීමට ඉලක්ක කළ ද බඳවාගෙන තිබුණේ 22,616 ක් වූයෙන් ආධුනික බඳවා ගැනීම් අඩුවීමට හේතු සොයාබලා ඒ සඳහා අවශ්‍යා කටයුතු සිදු කර නොතිබුණි.

(iv) වෙනත් වෘත්තීය පුහුණු ආයතනවල පුහුණු ලාභීන් 35,000 ක් කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කිරීමට ඉලක්ක කළද කාර්යස්ථ පුහුණුව සඳහා යොමුකර තිබුණේ 10,040 ක් එනම් සියයට 29 ක් වූ අඩු ප්‍රමාණයකි. තවද පුහුණුලාභීන් කාර්යස්ථ පුහුණුවට යොමු කිරීමට අවස්ථාවක් ඇති ආයතන සම්බන්ධකර ගැනීමට ඉලක්ක කර තිබුණද ඒ යටතේ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුල දී නිලධාරීන් 150 දෙනෙකු වෘත්තීය මාර්ගෝපදේශන කාර්යයන් සඳහා පුහුණු කිරීම ඉලක්ක කළ ද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

(vi) අධිකාරියේ කටයුතු සඳහා උපදේශකයන් 50 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලය 25 දෙනෙකු බඳවා ගැනීමට ඉලක්ක කළද එම බඳවා ගැනීම් කිසිවක් සිදු කර නොතිබුණි.

(vii) කර්මාන්ත සහායක සේවා හඳුන්වා දීම සඳහා වූ උප කාර්යයන් 5ක් වර්ෂය තුල දී ඉටුකර නොතිබුණි.

(viii) පෙර ඉගෙනුම් පසු හඳුනාගැනීමේ (RPL) ක්‍රමය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් රු. මිලියන 1.25 ක් වැයකර පැවැත්වීමට ඉලක්ක කළද වැඩසටහන් 20 ක් පවත්වා නොතිබුණි.

(ix) විශේෂ පුහුණු වැඩසටහන් යටතේ ආධුනිකයන් 1,000 ක් පුහුණු කිරීම අපේක්ෂා කළ ද පුහුණු කර තිබුණේ ආධුනිකයින් 262 දෙනෙකු පමණි.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති ආධාර යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පරිදි කාර්යයසාධනය පහත පරිදි වේ.

(i) 2015 වර්ෂය සඳහා පෙර ඉගෙනුම් පසු හඳුනා ගැනීමේ (RPL) ක්‍රමය මඟින් සහතිකපත් 5000 ක් ප්‍රදානය කිරීමට සැලැසුම් කළද ප්‍රදානය කර තිබුණේ සහතිකපත් 532 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ජාතික මධ්‍යස්ථාන 3 හි සහ දිස්ත්‍රික් මධ්‍යස්ථානවල 25 හි තත්ත්ව කළමනාකරණ පද්ධතිය (ISO Standard) ස්ථාපිත කිරීමට හා පවත්වාගෙන යාමට සැලසුම් කර තිබුණද මධ්‍යස්ථාන 2 ක පමණක් එම කටයුතු ආරම්භ කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

2014 ජූනි 04 වන දින රු. 4,974,144 ක් වැයකර ප්‍රධාන කාර්යාලයේ සවිකර තිබූ විදුලි සෝපානය 2015 සැප්තැම්බර් මාසයේදී අක්‍රියවී තිබුණි. නියමිත දිනදී විදුලි සෝපානය සේවා කිරීම සඳහා සේවා ගිවිසුමකට ඇතුළත්ව නොතිබීම හේතුවෙන් එය සේවා කිරීම සඳහා රු. 92,877 ක් ගෙවීමට අධිකාරියට සිදුව තිබුණි. එසේ වුවද 2015 සැප්තැම්බර් 29 දින රු. 376,623 ක් වැය කර පූර්ව කාලයද ඇතුලත් වාර්ෂික සේවා ගිවිසුමකට එළඹ තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ ආධුනිකයන් වෙත විකිණීම සඳහා ලබා දී තිබූ රු. 19,920 ක් වූ වැඩ පොත් 498 ක ඌනතාවක් නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂයේ මාතර ප්‍රදේශයේදී රු. 35,125,261 ක් වැයකර නිපුණතා අභිෂේක වැඩසටහනක් පවත්වා එහිදී නිෂ්කාර්ය වියදම් දැරීම සම්බන්ධයෙන් නොවිසඳුන ගැටළු පැවතියදී සමාලෝචිත වර්ෂයේ දී රු. 4,574,794 ක් වැයකර ගාල්ල ප්‍රදේශයේද එවැනිම වැඩසටහනක් පවත්වා තිබූ අතර එම වැඩසටහනේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පෙර ඉගැනුම පසු ඇගයුම් (RPL) වැඩසටහන මඟින් ආධුනිකයාගේ කුසලතාවයන් ප්‍රායෝගිකව ඇගයීම් කර ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ සහතික ලබාදීම සිදු කරන නමුත් ගාල්ලේ පැවති මෙම වැඩසටහනේ දී ඉදිරිපත්වන ශිල්පීන්ට බෙදා දීම සඳහා විධිමත් අනුමැතියකින් තොරව රු. 1,255,950 ක් වටිනා උපකරණ කට්ටල 550 ක් මිලදීගෙන තිබුණි.

(ii) මෙම වැඩසටහන සඳහා උත්සව භාණ්ඩ, කෑම, බීම සැපයීම හා උත්සව සංවිධානය සහ පෙදරේරු ශිල්පීන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම එකිනෙකට සම්බන්ධ නොවූ කාර්යයන් වුවද මෙම කාර්යයන් සඳහා එකම කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට අධිකාරිය කටයුතු කර තිබුණි. අවම ලංසු මිලට වඩා රු. 335,163 ක් වැඩියෙන් රු. 2,587,110 ක් වූ මිලට ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් ආයතනයක් වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(iii) මෙම වැඩසටහනේ දී පෙදරේරු ශිල්පීන් 250 දෙනෙකු ඇගයීමට අපේක්ෂා කර රු.923,660 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණ ද පැමිණ නොතිබූ ශිල්පීන් 72 දෙනෙකු වෙනුවෙන් ඉතිරිව තිබිය යුතු වූ භාණ්ඩ වල වටිනාකම මුළු භාණ්ඩ වටිනාකමට අනුපාතිකව රු. 182,180 ක ඌනතාවක් නිරීක්ෂණය විය.

(iv) වැඩසටහන අවසන් වීමෙන් පසු අමතරව සැපයුම් හා සේවා කළ බවට කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි විධිමත් පරිදි ප්‍රසම්පාදන කමිටු අනුමැතිය රහිතව උප සභාපතිවරයාගේ අනුමැතිය මත රු. 496,250 ක් ගෙවා තිබුණි. අමතර කූඩාරම්, විජ්ගල් හා කිරි පැකට් සැපයීම සඳහා වූ එම අතිරේක වියදම්, ගිවිසුම්ගත සමාන වියදම් සහ වෙළඳපොළ මිල ගණන් සමඟ සංසන්දනාත්මකව ඉතා අධික මිල ගණන් වූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ප්‍රදර්ශනාගාරය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රසිද්ධ ලංසු කැඳවීමකින් තොරව දේදුනු පැහැති පිටු මගින් තෝරාගත් ලංසුකරුවකු වෙත රු. 19,774,540 කට 2014 ඔක්තෝබර් 15 දින පිරිනමා තිබුණි. ගිවිසුම අනුව 2015 මැයි මාසයේදී ප්‍රදර්ශනාගාරය ඉදිකිරීම අවසන් කොට අධිකාරියට භාර දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් අවසන්කර අධිකාරිය වෙත බාර දී නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෙද සහායක පාඨමාලාව ආරම්භ කිරීම සඳහා 2011 හා 2012 වර්ෂවල පුහුණු මධ්‍යස්ථාන 10 ක් වෙත ලබා දී තිබූ වටිනාකම රු. 2,398,571 ක් වූ භාණ්ඩ එම පාඨමාලාව ආරම්භ නොකිරීම නිසා අදාල මධ්‍යස්ථානවල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2012 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් කල්මුණේ දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදී තිබූ අක්කරයක් වූ ඉඩම 2016 සැප්තැම්බර් 30 වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ කුරුණෑගල දී පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහන සඳහා මිලදී ගෙන තිබූ රු.1,464,848 ක් වූ පුහුණු උපකරණ පැවතියදී එම උපකරණ භාවිතා නොකර මාතර පැවති එවැනිම වැඩසටහනක් සඳහා උපකරණ තොගයක් මිලදී ගෙන තිබුණු අතර ඒවා භාවිතා නොකර ඔරුගොඩවත්ත ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයි එස් ඕ (ISO) තත්ත්ව පාලන කටයුතු සඳහා විවිධ වර්ණයන්ගෙන් යුතු ප්ලාස්ටික් ලිපිගොනු කවර 8,655 ක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය භාණ්ඩවල පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කලින් තීරණය කර නොතිබියදී අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුගේ භාණ්ඩ අවශ්‍ය පිරිවිතරවලට අනුකූල නොවන බව දක්වමින් අවම මිලට වඩා රු. 771,131 ක් වැඩියෙන් මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවකු තෝරාගෙන රු. 3,793,434 ක ගිවිසුමකට එළඹ තිබුණි.

2016 ඔක්තෝබර් මාසය වන විට මෙම ලිපිගොනු කවරවලින් රු. 2,955,644 ක් වටිනා ලිපිගොනු කවර 5781 ක් අවශ්‍යතාවයන්ට නොගැලපීම හා වෙනත් හේතු මත භාවිතා කර නොතිබුණු අතර ඒවා ආරක්ෂිත ලෙස ගබඩා කර ද නොතිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්**

අධිකාරියේ සේවකයන් දෙදෙනෙකු රේඛීය අමාත්‍යාංශයට හා තවත් සේවකයන් 07 දෙනෙකු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත මාස 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ද, එක් අයෙකු 2015 දෙසැම්බර් 09 දින සිට විගණන දිනය වූ 2016 ඔක්තෝබර් 25 දක්වාද මුදාහැර තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 1358 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 869 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 489 ක් වූ අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. පුරප්පාඩු තනතුරුවලින් කථිකාචාර්ය, පුහුණු නිලධාරී, උපදේශක හා පරීක්ෂක යන අනුමත අධ්‍යයන තනතුරු 784 න් තනතුරු 353 ක් එනම් සියයට 45 ක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ පුහුණු හා පරීක්ෂණ කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂයේ සිට අධිකාරියේ ඉදිකිරීම් හා නඩත්තු අංශයේ සහ 2009 වර්ෂයේ සිට වාහන නඩත්තු කටයුතු සඳහා රාජකාරී පැවරුම් පදනම මත නිළධාරීන් දෙදෙනෙකු බඳවාගෙන විගණිත දිනය වූ 2016 ඔක්තෝබර් 25 දක්වාම සේවයේ යොදවා තිබූ නමුත් එම කාර්යයන් සඳහා අධිකාරියට සෘජුව වගකියන ස්ථිර නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කටුබැද්ද ආධුනිකත්ව අභ්‍යාස ආයතනයට අයත් අංක 5/B1/01 දරන නිල නිවස බාහිර පාර්ශවයකට කුලී පදනම මත ලබාදීම මඟින් රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කිරීමට ඉඩහැරීම යන චෝදනාව මත වැඩ තහනම් කරන ලද ගණකාධිකාරීවරයකු සම්බන්ධයෙන් කරන ලද මූලික පරීක්ෂණ වාර්තාව අස්ථානගතව තිබූ අතර 2015 ජනවාරි 19 දින සිට එම නිලධාරියා නැවත සේවයේ පිහිටුවා තිබුණි. නැවත නව මූලික පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබියදී එම නිලධාරියා වෙත කොළඹ විශ්වවිද්‍යාලය මඟින් පවත්වන පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රු. 122,500 ක් අධිකාරිය මඟින් ලබාදී තිබුණි.

(ඇ) නියමිත පරිදි ඉදිරි වැඩසටහන් සහ නිවාඩු අනුමත කර නොගැනීම නිසා දිස්ත්‍රික් භාර නිලධාරියකුගේ 2013, 2014 හා 2015 වර්ෂ සඳහා වූ වැටුප් රහිත නිවාඩු දින පිළිවෙලින් 173 ක් 191.5 ක් හා 05 ක් ලෙස දින 369.5 ක් වී තිබූ අතර ඒ සඳහා ගෙවන ලද වැටුප් ගණනය කර 2016 ඔක්තෝබර් වන විටත් අයකර නොතිබුණි.

## 4.9 වාහන උපයෝජනය

---------------------

අධිකාරියේ වාහන නඩත්තුව සහ පාලනය සම්බන්ධ විධිමත් ක්‍රමවේදයක් නොතිබූ අතර ඒ සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී ජර්මානු ජාත්‍යන්තර ආධාර (ජී අයි ඉසෙඩ්) සංවිධානයෙන් ලැබී ධාවන තත්ත්වයේ තිබූ වාහනයක එන්ජිම වෙනත් වාහනයකට සවිකර තිබූ අතර ඒ සඳහා රු. 185,000 ක් වැයකර තිබුණි. එහෙත් දින 35 කට පසු එම වාහනයේ කොටසක් (ක්ලච්) ක්‍රියා විරහිත වීම නිසා එය භාවිතයෙන් ඉවත් කර 2016 වර්ෂයේ දී අපහරණය කර තිබීමෙන් වැය කරන ලද රු. 185,000 නිෂ්ඵල වියදමක් විය.

(ආ) 2007 වර්ෂයේ සිට ධාවනය කර නොතිබූ වාහනයක් 2012 සැප්තැම්බර් මාසයේ දී රු.194,950 ක් ගෙවා පින්තාරු කර රු. 145,976 ක් අළුත්වැඩියාවක් සඳහා වියදම් කර අළුත්වැඩියාවෙන් පසු කිලෝමීටර් 102 ක් පමණක් ධාවනයෙන් පසුව මෙම වාහනය අපහරණය කර තිබුණි.

(ඇ) 2007 සිට 2014 වර්ෂය දක්වා එන්ජිමේ අලුත්වැඩියාවක් සඳහා යොමු කර තිබූ වාහනයක් 2014 වර්ෂයේදී රු. 1,683,500 ක් ගෙවා අළුත්වැඩියා කර තිබුණි. 211 දී අළුත්වැඩියාව සඳහා වූ ඇස්තමේන්තුව රු. 918,428 ක් වූ අතර 2014 දී අළුත්වැඩියාව සඳහා රු. 765,072 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

අධිකාරියට අයත් ඔරුගොඩවත්තේ පිහිටි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහාය, වාහන අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ලබාගත හැකිව තිබිය දී සහ කාර්ය පැවැරුම් මත වාහන නඩත්තු කටයුතු සඳහා නිලධාරියෙකු 2009 වර්ෂයේ සිට සේවයේ යොදවාගෙන තිබියදී මෙම අඩුපාඩු සිදුවී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

අධිකාරිය විසින් සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවන පරිදි කාර්යසාධන වාර්තාව සකස්කර නොතිබූ අතර පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි මූලා ප්‍රගතිය ඇතුළත්කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

2009 ජූනි 09 දිනැති අංක ඩී. එම්එ/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නිලධාරීන් 08 දෙනෙකු අනුයුක්ත කර තිබූ නමුත් විගණන සැලැස්මට අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කටයුතු හා පෙන්වා දී තිබූ කරුණු නිවැරදි කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොකිරීම නිසා එම ඒකකය පවත්වාගෙන යාමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 369 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී ලෝක තරුණ සමුළුව සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් අධිකාරිය වැය කළ රු. 2,000,000 ක මුදල ලැබිය යුතු ශේෂ යටතේ දක්වා නොතිබුණි.

(ආ) විනය පරීක්ෂණයකින් අනතුරුව සේවයෙන් පහ කරනු ලැබූ නැතහොත් සේවය අවසන් කරනු ලැබුවා වූ සේවකයෙකු රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීමට නුසුදුසු වන නමුත් මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් චෝදනා ලැබ 2013 මැයි 08 දින වැඩ තහනමට ලක්වූ වෙනත් ආයතනයක නිලධාරියෙකු අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) තනතුරට බඳවා ගෙන තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | | නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) | ගබඩා පාලනය | (i) | සියළු ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම් පොත්වලට ඇතුලත් නොකිරීම. |
| | | (ii) | නිපුණතා අභිෂේක වැඩසටහන් සඳහා කරන ලද ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම් පිළිබඳ ගබඩාකරුවන් මඟින් තහවුරු කර නොගැනීම. |
| (ආ) | වාහන උපයෝජනය | (i) | අවශ්‍ය අවස්ථාවලදී වාහන අළුත් වැඩියාවට යොමු නොකිරීම නිසා වාහන අබලන් තත්ත්වයට පත් වීම. |
| | | (ii) | සුදුසුකම්ලත් නිලධාරින්ගේ පරීක්ෂාවකින් හා ඇස්තමේන්තුවලින් තොරව වාහන අළුත් වැඩියා සඳහා යොමුකිරීම නිසා නිෂ්කාර්ය වියදම් දැරීමට සිදුවීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් පරිදි බඳවා නොගැනීම නිසා පුහුණු කටයුතු සඳහා බාධා පැමිණීම. |
| | | (ii) | රහස්‍යතාවය සහ ආරක්ෂාව සැපයෙන පරිදි පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම, විනය පරීක්ෂණ පැවැත්වීම හා එම තීරණ ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) | මූල්‍ය කළමනාකරණය | | විධිමත් අනුමැතියකින් තොරව අරමුදල් පවත්වාගෙන යාමට ඉඩහැරීම නිසා මුදල් නිෂ්කාර්යව පැවතීම. |
| (ඉ) | පොත්පත් හා ලේඛන පවත්වාගැනීම. | | කටුබැද්ද ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ විදුලි කාර්මික අංශයේ භාණ්ඩ 800 ක් බඩුවට්ටෝරු පොත්වල ඇතුලත් නොකිරීම. |